

## ප්‍රේමයේ හිතවත්කම
### කල්පනා ඇම්බ්‍රෝස්

පරවුනත් මලක නො සිඳෙයි තුරු මුල් දැරූ දුක් කඳ
සිරකළත් සඳ ගිරිගක කිරණ සඟවනු කෙලෙසද
පෙරඹරක පින්න අරගෙන රාත්‍රිය සැඟව යන කොට
පර නොවුණු කවි වස්සම් ඔබ ඇවිත් ඉන්න අහසට

අමුණා පෙඳෙන් පෙඳ ගෙන දැඩි කළ සුපෙම් විහඟුන්ට
සරනා මිසෙක සිත් ගැබ තව සුව වෙත් ද විඳගන්ට
මියෙනා ලොවක හැම දෙය පෙමත් අනියතැයි නො කියන්න
සිඳුණා වුනත් නියඟෙක ගඟකට හැකිද නවතින්න

නිල් දිය සරැලී නංවා හිම කැටි දියව ගලා යන
මල් අරන් දෑතට වසන්තය ඇවිදින් සිනාසෙන
මල් පෙති පරව එළඹෙන නිහඬ දවසක උදෑසන
සමුගත යුතු නොවෙද අප දෑසම තදින් වසාගෙන

පෙත්තෙන් පෙත්ත පීදෙන රුසිරු ජීවන මල්කම
ගෙත්තම් කළේ හෙමිහිට ප්‍රේමයේ හිතවත්කම
ඇත්නම් යමක් රැකගත් එක්ව ඇදි ඒ සිත්තම
ඇත්තයි මියෙන මොහොතක ඔබ තමයි මගෙ වත්කම

## පතොක් මල්
### මාලන් බණ්ඩාර කපුවත්ත

.
දා ගිය බිම් කඩක
ඉතිරිව වැඩුණු එක දෙක
තු තුරු පවා තම කිස
අත්හැර දමන අරුමය
.
දිය වුල් බිබී රජ වුණ
හිරු ඔද බිදින නොදැමුණ
වැලි තෙල පලා මතු වුණ
කුරු තුරු පතොක් ක පත
.
ගැඹුරින් තියාගෙන පය
ළය අග හොවා තෙතමන
දෝතින් වඩා හිරු දෙස
පානා මෙනිය මල් පැස




## නොලියු කවිය
### විද්‍යානි මනතුංග

අප හැමෝගෙම කවි අතරතුර
නොලියවුණු එක කවක් තිබුණා
නොසෙල් වී දුක් වින්ද කඳුලක්
ඒ කවේ කලලය ද සිතුණා

කොයි තරම් වෙහසුනත් ඒ කව
නොලිය වූ පද අතර රැඳුණා
ලොව ම නොදකින දේ දකින්නට
ඒ කවෙන් නෙතු පියන් ලැබුණා ....






## දුර්ලභ ජනකවි

**ඉතාම අප්‍රකට ජනශ්‍රැතියේ එන ළගන්නා සුළු දුර්ලභ ගණයේ ගැඹුරු අර්ථ උද්දීපනයෙහි සමත් ජනකවි කිහිපයකි.**

අඳුරේ කළුවරේ පඳුරට මුවාවෙලා
විදුලිය එළිය දැක ගිණිහුල දියේ හෙලා
අනුන් ලියන් දැක තම ලියට තල තලා
දුවන මුවන් දැක නොමදව නෙලූ පලා

කඩුල්ලේ තරම දැනගෙන කඳ බඳිනු
ගොඩැල්ලේ තරම දැනගෙන ලිඳ කපනු
බොරැල්ලේ තරම දැනගෙන උඩ පනිනු
තමන්ගේ තරම දැනගෙන වැඩ කරනු

කාලා තණකොළ ද ගෙරි පහරනා ගොම
ගාලා ගොවි ගෙදර පිරිසිදු කලා බිම
කාලා රස අහර පහරන මිනිස් ගොම
වේලා ගයෙන් ගෑවොත් කොහොමද? ගෙබිම

(වේලාගයෙන් = ලාටු)

දුවන හොරුන් පස්සේ එලවන්ඩ එපා
මරිච්ච මිනිය වත්තේ වලලන්ඩ එපා
ඉරිච්ච රෙද්ද මහලා පොරවන්ඩ එපා
ඇරිච්ච දිගේ ගෙදරට කැදවන්ඩ එපා

හුරු නැති මඟක ගොස් උගුලක වැටෙනු එපා
කළුවර ගලද්දී තනි මඟ ඇදෙනු එපා
සිරිකත මැවූ සිරි දෙනයන මතනු එපා
පියවර සොයා මා තනිකර යන්න එපා

මෙම ජනකවි පද්‍ය පංතිය ලියා එවන ලද්දේ ඩැංඩිකොන් ධම්ම දීප භාවනා මධ්‍යස්ථානයේ වැඩ වසන නිකවැරටිය බුදුමුත්තාව රාජ මහා විහාරාධිපති **ශාස්ත්‍රපති පූජ්‍ය දොඩංගොල්ලේ ධම්මාරාම නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ විසිනි.**

## පලක් වුවද?
### ඉදුසර රණසිංහ

ගාලු වෙරලට අහ්මබෙන් ආ අනාරාධිත අමුත්තන්
උදම් අනමින් ගලුත් බිඳිමින් පුරා සව්දිය රැගුවන්
අපේ උදවිය එදා දුටු ඒ පෙරනිමිත්තත් සැබෑවන්
වයින් බඳුනේ පුරා බිව්වේ අපේ රුධිරය එදා උන්

රටේ නිදහස දිනා දුන් ඒ උතුම් මිනිසුන් දෙවි වුනේ
එයින් මත්තට ආපු ඇත්තෝ ගැත්තො කරපිට වැජඹුනේ
කතාවෙන්නම් මහා වීරයෝ, රටේ සෙතටලු කැපවුනේ
ඉතින් වැන්දා තොරණ් බැන්දා අනේ කවුරුද රැවටුනේ

ලන්සි බලඇණි නැවෙන් අවුදින් පරංගින් පළවා දැමුවට
එංගලන්තේ රාජ උණුසුම ලන්සි බලකොටු මෙල්ලකෙරුවට
සුද්දන්ගෙන් දිනු රටේ බලතල පාට දේදුනු මාරු කෙරුවට
ඉගුරු දී අපි මිරිස් ගත්තට සම්බලේකට පලක් වුවද?

## අලුත් ඉරක් හඳක්

පුංචි පුංචි ලෝකයක්
මැවී ඇතේ අතේ
පස් වසක් බලා සිටි
නැවුම් ලොවක් අගේ
කිරි සිනා පෙරී පෙරී
දෝරේ යයිතිරි..

පුංචි අපේ ලෝකෙටත්
අලුත් ඉරක් හඳක්
ඇවිත්...

### ප්‍රසාදිනී වෙත්තසිංහ
මිල්පාක්



සිතුවම කවකි කවියද සිතුවමකි ඔබේ

## සමුගත් දයා
### ජගත් වෙත්තසිංහ

සිතුවම් කලාවේ අඩසිය වසක මග
කිතු රැස විහිදුවන පුන් සඳ පරිදි නැග
මතු කළ චමත්කාරය තෙලි තුඩිනි අග
මුතු විසිරුවා මෙනි සිරි සරසවිය ළග

පොදු ජන වහර පිළිබඳ ගරු කරන සබේ
කවුරුත් මඩිස්සලයට නිරතුරුව එබේ
නවතාවෙන් යුතුව රස මුසු කරුණු ලැබේ
සිතුවම කවකි කවියද සිතුවමකි ඔබේ

සක්විති සුවය ලැබ හුලවාලිය බැන්ද
යනවිට බොරළු පාරෙන් තවලම ඇන්ද
ආදර කොමා ඔබ අද නිහඬව මන්ද
ඔබ නැති පුවත මට අදහනු පුලුවන්ද

## කඩිසරකම
### සිසිර දිසානායක

දොර ඇරලා තිව්වොත් නම්
වහලෙ විදුලි එළිය වටා
කුරුමිණියෝ රූං ග - ගා
පළගැටියෝ ක්‍රීං ග - ගා
උඩ පැන - පැන කැරකි - කැරකි
"චිටිස්" "පිටිස්" හඬ නගමින්
බිමට වැටෙති - පියඹා යති

මගෙ පාළුව මකා යන්ට
ආව මගේ යාලුවන්ට
නිවනක් නෑ නිකං ඉන්ට
නටාපුදෙන් ඇතිවෙනකල්

ඇඳේ කොට්ට රත් කර - කර
කම්මැලිවට මං උන්නට
මගේ පුංචි යාලුවන්ට
හරි - හරියට හරියට වැඩ

විදුලි එළිය උන් ලොකු කර
බිත්ති හතරෙ හෙවණැලි ඇඳ
කම්මැලි මට පෙන්නා දෙයි
යාළුවන්ගෙ කඩිසර කම

**වසර 1987 දී කියූ කවිපෙළකින් උපුටා ගත් කවි කීපයකි**